සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2020 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2020-10-03
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ශ්‍රී ලංකාවේ වඩාත්ම උත්තරීතර නීති මූලාශ්‍රය වන්නේ:

(1) සිවිල් නීතියයි. (2) අපරාධ නීතියයි.
(3) ආණ්ඩු ක්‍රම ව්‍යාවස්ථාවයි. (4) නඩු තීරණ නීතියයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) මිල. (2) අයිතිය පැවරීම.
(3) භාණ්ඩ. (4) ස්ථානය.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කරන ගෙවීම් ක්‍රමයක් **නොවන්නේ** කුමක් ද?

(1) ණයවර ලිපි. (2) චෙක්පත්.
(3) විනිමය බිල්පත්. (4) අත්තිකාරම් ගෙවීම්.

**1.4** 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් [Employees' Provident Fund (EPF)] පනතෙන් ආවරණය කරනු **නොලබන** සේවකයන් වන්නේ:

(1) අනියම් සේවකයන්. (2) තාවකාලික සේවකයන්.

(3) රජයේ සේවකයන්. (4) ස්ථිර සේවකයන්.

**1.5** රු.40,000/- ක මාසික වැටුපක් මත, 2010 අප්‍රේල් 01 දින **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** විධායකයෙකු ලෙස **අමල්** සේවයට බැඳුණේය. 2019 අප්‍රේල් 01 දින ඔහුට කළමනාකරුවෙකු ලෙස උසස්වීමක් ලැබුණි. 2020 අප්‍රේල් 10 දින, ඔහු **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමෙන්** ඉල්ලා අස්වූ අතර, ඔහුගේ අවසාන මාසයේ වැටුප රු.150,000/- ක් විය.

පාරිතෝෂික (gratuity) හිමිකම ලෙස ගෙවිය යුතු මුදල වන්නේ:

(1) රු.200,000/- කි. (2) රු.750,000/- කි. (3) රු.1,500,000/- කි. (4) රු.150,000/- කි.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, 1950 අංක 53 දරණ කාර්මික ආරවුල් පනත අනුව ආරවුල් විසඳීමේ ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) සාමූහික ගිවිසුමක් මගින්. (2) කම්කරු උසාවි මගින්.

(3) සමගි කිරීම මගින්. (4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක **1.7** සිට **1.9** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** ශ්‍රී ලංකාවේ පොදු නීතිය වන්නේ රෝම ලන්දේසි නීතියයි.

**1.8** අර්පණලාභියාගේ මරණය හේතුවෙන් ගිවිසුමක් ව්‍යර්ථ වීම මගින් (by frustration) එය අවසන් කළ හැකිය.

**1.9** විකුණුම්කරු විසින් නොසැලිමත්කම ලෙස භාණ්ඩ ගැනුම්කරුට බාරදීම ප්‍රතික්ෂේප කරන විට, බාර නොදුන් භාණ්ඩ සම්බන්ධයෙන් සිදුවූ හානිය ලබා ගැනීමට නෛතික හිමිකමක් ගැනුම්කරුට නොමැත.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක **1.10** සිට **1.14** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** ආයෝජන මණ්ඩලයේ කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ගැනුම්කරුවෙකුට තිබෙන ප්‍රතිකර්ම (remedies) දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** සේවක භාරකාර අරමුදලේ (Employees' Trust Fund) ශේෂය ආපසු ලබා ගැනීමට සේවකයෙකුට ඉඩ ලැබෙන අවස්ථාවන් (instances) දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.13** නෞභාර පත්‍රයක (bill of lading) ඇතුළත් කළ යුතුව ඇති වැදගත් කරුණු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.14** පාරිභෝගික කටයුතු අධිකාරියේ අරමුණු (objectives) දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

(a) **රාජා, නිමල්** සහ **සුමනා** රට පුරා විසිරී සිටින කුඩා ප්‍රමාණයේ විකුණුම්කරුවන්ගෙන් කුළු බඩු මිලට ගෙන **"හෙළරස"** නම්වූ වෙළෙඳ ලකුණක් යටතේ ඒවා ඇසුරුම් කර විකිණීමේ නිරතව සිටින **හෙළරස හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවන් වෙති. හවුල් ව්‍යාපාරයේ කටයුතු කරගෙන යාමේදී ඔවුහු 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන අනුගමනය කරති. හවුල් ව්‍යාපාරයේ සම්බන්ධකම් භාවිත කරමින් **සුමනා** ඇගේ සැමියා සමඟ හවුල් ව්‍යාපාරයට සමාන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. කෙසේවෙතත්, **සුමනා** විසින් අනෙකුත් හවුල්කරුවන් වෙත මේ බව දන්වා නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

හවුල්කරුවකු වශයෙන් **සුමනා** ඇයගේ යුතුකම් (duties) පැහැර හැර (breached) තිබේදැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 06)

(b) **හෙළරස හවුල් ව්‍යාපාරය** පවත්වාගෙන යන අතරතුර **නිමල්** නිත්‍ය සැපයුම්කරුවෙකු වන **පියල්ගෙන්** ණය පදනම මත රු.500,000/- කට කුරුඳු සහ ගම්මිරිස් තොගයක් ලබාගෙන එය වෙනත් තුන්වන පාර්ශවයේ ගැනුම්කරුවෙකුට රු.600,000/- කට විකුණුවේය. එම ලැබුණු මුදල වැරදීමකින් ඔහුගේ බිරිඳගේ පුද්ගලික ගිණුමට තැන්පත් කරන ලදී. පසුව, ඇයගෙන් අයකර ගත යුතුව තිබූ පුද්ගලික ණය මුදලක වාරික දෙකක් එම මුදලෙන් බැංකුව විසින් අයකර ගන්නා ලද අතර, දැනට ඇගේ ගිණුමේ එම මුදල නොමැත.

තමාට අයවිය යුතු මුදල **පියල්** විසින් **හෙළරස හවුල් ව්‍යාපාරයෙන්** ඉල්ලා සිටි අතර, **රාජා** සහ **සුමනා, පියල්** ට ගෙවීම ප්‍රතික්ෂේප (denied) කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**හෙළරස හවුල් ව්‍යාපාරයෙන්, පියල්ගේ** මුදල අයකර ගැනීමට ඔහුට නෛතික හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**ටිම්බර් ස්ටෝර්ස්** හි අයිතිකාරිනිය වන **කුමුදු,** ඇගේ ව්‍යාපාරය ලාභ ඇතිව කළමනාකරණය කරමින් මෙහෙයවීම සඳහා ඇය විසින් **මාලක** ට බලය පවරන ලදී. ඔවුන්ගේ ගිවිසුමේ කොටසක් වශයෙන් කිසිදු තත්ත්වයක් යටතේ කළුවර දැව නොවිකිණිය යුතු බවට **මාලක** වෙත පැහැදිලි ලෙස උපදෙස් ලබා දී තිබුණි. තවද ව්‍යාපාර පරිශ්‍රයේ අළුත්වැඩියාවන් සහ නඩත්තු කිරීම් සම්බන්ධයෙන් ගිවිසුමේ කිසිවක් සඳහන් වී නොතිබුණි. ව්‍යාපාර පරිශ්‍රයේ ජල නල පද්ධතියේ සිදුවූ හදිසි හානිවීමක් නිසා, ණය පදනමට එය අළුත්වැඩියා කිරීම සඳහා ජලනල කාර්මිකයෙකු වන **පොඩි-බාස්, මාලක** විසින් කුලියට යොදවන ලදී. පසුව, **පොඩි-බාස්** ඔහුගේ ගාස්තුව **මාලකගෙන්** ඉල්ලා සිටියේය. **පොඩි-බාස්** ට ගෙවිය යුතු ගාස්තුව නොගෙවන ලෙස **කුමුදු** කියා සිටියේ **මාලක** ට එබඳු බලය පැවරීමක් ඇය සිදුකර නැතැයි කියමිනි.

මේ අතරතුර, **මාලක** විසින් කළුවර ලී කඳක් **රේණුකා** ට විකුණන ලදී. පසුව එය නියම කළුවර ලී කඳක් නොවන බව **රේණුකා** තේරුම් ගත් බැවින් ඇය **කුමුදුගෙන්** වන්දි ඉල්ලා සිටියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **කුමුදු** සහ **මාලක** අතර ඇති නියෝජ්‍යත්ව සම්බන්ධතාවයේ ස්වභාවය (nature) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **කුමුදුගේ** නියෝජිතයා ලෙස **මාලක** විසින් ඇතිකර ගන්නා ලද පහත සඳහන් එක් එක් ගිවිසුම යටතේ **කුමුදුගේ** වගකීම (liability) **විමසන්න:**

(i) **පොඩි-බාස්** සමඟ.

(ii) **රේණුකා** සමඟ. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) **ඇන්** විසින් ඇයගේ නිවස ගින්නෙන් ආරක්ෂණය කර ගැනීම සඳහා **සීමාසහිත XYZ රක්ෂණ සමාගමෙන්** සහ **සීමාසහිත ABC රක්ෂණ සමාගමෙන්** රක්ෂණ ඔප්පු දෙකක් ලබා ගත්තාය. **සීමාසහිත XYZ රක්ෂණ සමාගමේ** සහ **සීමාසහිත ABC රක්ෂණ සමාගමේ** රක්ෂණ ආවරණයන්ගේ වටිනාකම පිළිවෙලින් රු. මිලියන 3 ක් සහ රු. මිලියන 4 ක් විය. විදුලිය කාන්දුවීමක් හේතුවෙන් හටගත් ගින්නකින් නිවස හානියට පත්වූ අතර, ගින්න නිසා වූ අලාභය රු.500,000/- ක් විය. **ඇන්** රක්ෂණ සමාගම් දෙකෙන්ම රු.500,000/- බැගින් හානි සඳහා හිමිකම් පෑවාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ඇන්ට,** රක්ෂණ සමාගම් දෙකෙන්ම රු.500,000/- බැගින් ලබාගැනීමට හිමිකම් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) කුලී සින්නක්කර ගිවිසුම් (hire purchase agreements) යනු කුලී ගැනුම්කරු සහ භාණ්ඩ හිමිකරු (owner) යන පාර්ශව දෙක අතර ඇතිවන ගිවිසුම් වේ. මෙවැනි ගිවිසුම්වලදී පාර්ශව අතර එකඟ වූ පරිදි කුලී ගෙවීම් සිදුකර අවසානයේදී කුලියට ගත් අයිතමය භාණ්ඩ හිමිකරුගෙන් මිලට ගැනීමේ විකල්පය ද සහිතව කුලී ගැනුම්කරු විසින් කිසියම් අයිතමයක් කුලියට ලබා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කුලී සින්නක්කර ගිවිසුමකට අදාලව කුලී ගැනුම්කරුගේ වගකීම් (obligations) තුනක්(03) සහ භාණ්ඩ හිමිකරුගේ වගකීමක්(01) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) කොළඹ 05 පිහිටි **වීනාගේ** නව නිවසේ අභ්‍යන්තර ගෘහ අලංකරණ කටයුතු (interior designing) සිදුකිරීම සඳහා **ප්‍රියා** ව කුලී පදනම මත යොදවා ගන්නා ලදී. ව්‍යාපෘතිය නිමකළ පසු **ප්‍රියා** විසින් ඉටුකළ සේවාව සඳහා එකඟවන ලද ගෙවීම වෙනුවෙන් *"ගනුදෙනු කළ නොහැක"* යනුවෙන් රේඛනය කරන ලද රු.300,000/- ක චෙක්පතක් **වීනාගෙන්, ප්‍රියා** වෙත ලැබුණි. චෙක්පත කවුන්ටරයෙන් මුදල් කර ගැනීම සඳහා **ප්‍රියා** බැංකුව වෙත ගියාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) කවුන්ටරය හරහා චෙක්පත මුදල් කරගැනීමට **ප්‍රියා** ට හිමිකමක් තිබේදැයි (entitled) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(ii) ගනුදෙනුකරුවෙකු විසින් අණ කරනු ලබන චෙක්පතකට ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට බලය ඇති අවස්ථා තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) **ලලිතා,** දෙවසරකට පෙර **අරලිය ටෙක්ස්ටයිල්ස්** නම්වූ සුප්‍රසිද්ධ රෙදිපිළි වෙළෙඳ සැලේ සේවයට බැඳුණාය. පසුගිය සතියේ ඇය විසින් රජයේ රෝහලකදී ඇයගේ දෙවන දරුවා ප්‍රසූත කළාය. ඇයගේ ප්‍රසූත නිවාඩු අයදුම්පත යැවූ විට **අරලිය ටෙක්ස්ටයිල්ස්** ආයතනයේ අයිතිකරු විසින් ඇයට වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම ප්‍රතික්ෂේප කළ අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි ඇයගේ සේවය අවසන් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

1954 අංක 19 දරණ සාප්පු සහ කාර්යාල පනත යටතේ **ලලිතාට** වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාගැනීමට හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත අනුව මූල්‍ය ආයතන විසින් අනන්‍යතාවය හඳුනාගැනීම කළ නොහැකි ගිණුම් දරන්නන් වෙනුවෙන් එවැනි ගිණුම් විවෘතකර මෙහෙයුම් කටයුතු නොකළ යුතු අතර, ඊට අනුකූලව ගනුදෙනුකරුවන් විසින් අලුත් ගිණුම් විවෘත කරනු ලබන විට, එම මූල්‍ය ආයතන විසින් ඇතැම් තොරතුරු ලබාගත යුතු වන්නේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අලුත් ගිණුමක් විවෘත කරන විට මූල්‍ය ආයතනයක් විසින් පුද්ගලයෙකුගෙන් ලබාගතයුතු ලියකියවිලි වර්ග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත වෙනස්වන ව්‍යාපාරික පරිසරයක් තුළ වැදගත් පනත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ප්‍රකාර නීතිවිරෝධී ක්‍රියාකාරකම් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(ii) පරිගණක අපරාධ පනත යටතේ ආවරණය වන වැරදි (offences) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) ආයුර්වේද වෛද්‍යවරයෙකු වන **වෛද්‍ය පෙරේරා** ඔහුගේ පාරම්පරික වෛද්‍ය ප්‍රතිකාරවලදී දේශීය ශ්‍රී ලාංකීය කුරුඳු වර්ගයක් වන *"දවුල් කුරුඳු"* අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කරයි. පෙබරවාරි මස 17 වන දින, ගාල්ලේ ජීවත්වන, කුරුඳු සැපයුම්කරුවෙකු වන **බණ්ඩා** ට ඔහු දුරකතන ඇමතුමක් දී කිලෝග්‍රෑමයක් රු.1,000/- බැගින් *"දවුල් කුරුඳු"* කිලෝග්‍රෑම් 50 ක් සැපයීමට අර්පණයක් කළ අතර, ප්‍රතිග්‍රහණය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, ලිපියක් මගින් තැපැල හරහා එවීමට **බණ්ඩා** එකඟ විය. පෙබරවාරි 18 දින, සඳහන් කළ මිලට, එකී *"දවුල් කුරුඳු"* ප්‍රමාණය සැපයීමට ඔහු විසින් ප්‍රතිග්‍රහණය කළ බවට සඳහන් ලිපියක් **බණ්ඩා** විසින් **වෛද්‍ය පෙරේරා** වෙත තැපැල් කරන ලදී. එම ලිපිය **වෛද්‍ය පෙරේරාගේ** නිවසට ලැබුණේ පෙබරවාරි 21 දිනය. මේ අතරතුර, පෙබරවාරි 19 දින, **වෛද්‍ය පෙරේරා** වෙනත් කුරුඳු සපයන්නෙකු වන **ශිවාට** එම *"දවුල් කුරුඳු"* ප්‍රමාණයම කිලෝග්‍රෑමයක් රු.900/- බැගින් සැපයීමට අර්පණය කරන ලද අතර, **ශිවා** විසින් එය ප්‍රතිග්‍රහණය කරන ලදී. පෙබරවාරි 22 දින උදෑසන **බණ්ඩා** ඉල්ලා තිබූ *"දවුල් කුරුඳු"* කිලෝග්‍රෑම් 50 ද රැගෙන **වෛද්‍ය පෙරේරාගේ** නිවසට පැමිණි නමුත් **වෛද්‍ය පෙරේරා, බණ්ඩාගේ** කුරුඳු ප්‍රතික්ෂේප කළේය.

මේ අතරතුර කාලයේ **වෛද්‍ය පෙරේරා** විසින් *"දවුල් කුරුඳු"* සාරය හිසකෙස් වර්ධන ආලේපයක් ලෙස ද භාවිත කළ හැකි බව සොයාගත් අතර, **"Black & Long"** නමින් කේශාලේප නිෂ්පාදිතයක් සංවර්ධනය කරන ලදී. ඔහු ඒ පිළිබඳව පුවත්පත්වල පහත දැක්වෙන දැන්වීම් සටහන පළ කළේය,

*"නිෂ්පාදිතය සමඟ සපයනු ලබන මුද්‍රිත මඟපෙන්වීම් අනුව **"Black & Long"***
*දිනකට 3 වරක් බැගින් දින 6 ක් භාවිත කිරීමෙන් පසු හිසකෙස්*
*ගැලවීයාමක් හෝ ඕනෑම හානියක් හෝ වන ඕනෑම කෙනෙකුට **වෛද්‍ය***
***පෙරේරා** විසින් රු.100,000/- ක ත්‍යාගයක් පිරිනමනු ලැබේ."*

නුදුරු අනාගතයේදී ජාතික රූපවාහිනී නාලිකාවක "අවුරුදු කුමාරි තරඟයක්" සඳහා සහභාගී වීමට සැලසුම් කරන **විශාකා, "Black & Long"** බෝතලයක් මිලදීගෙන නියම කර තිබූ ආකාරයට එය ආලේප කරන ලදී. එය ආලේප කිරීමෙන් පසු, හත්වෙනි දින **විශාකා** ස්නානය කළ අවස්ථාවේ ඇගේ දිගු කෙස් කලඹෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් ගැලවී ගියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පහත සඳහන් දෑ **පැහැදිලි කරන්න**:

(i) **වෛද්‍ය පෙරේරා** සහ **බණ්ඩා** අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 04)

(ii) **වෛද්‍ය පෙරේරා** සහ **විශාකා** අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 04)

(b) **වෛද්‍ය පෙරේරා** සම්බන්ධයෙන් **බණ්ඩා** ට සහ **විශාකා** ට තිබෙන හිමිකම් (rights) සහ ප්‍රතිකර්ම (remedies) **විමසන්න**. (ලකුණු 07)

(B) තොග සැපයුම්කරුවෙකු වන **රවීගෙන්, මොහාන්** විසින් පරිප්පු කිලෝග්‍රෑම් 100 ක් සඳහා මිලදී ගත්තේය. ඒවා ගෙනැවිත් බාරදීමට **රවී** සූදානම් වූ අවස්ථාවේ **මොහාන්** ඉල්ලා සිටියේ **මොහාන්** පැමිණ බඳාදා ඒවා තම තොග ගබඩාවට ගෙන යන තෙක් **රවීගේ** තොග ගබඩාවේ ම පරිප්පු තොගය රඳවා තබාගන්නා ලෙසය. ඉල්ලා සිටි පරිදි **රවී** විසින් ඔහුගේ තොග ගබඩාවේ එකී පරිප්පු තොගය වෙනම ම තබා තිබුණේය. අඟහරුවාදා රාත්‍රියේ ප්‍රදේශයට ධාරානිපාත වර්ෂාවක් ඇද හැලී **රවීගේ** තොග ගබඩාව ජලගැල්මකට ලක් විය. **මොහාන්** විසින් නැවත මුදල් ඉල්ලා සිටි අතර, පරිප්පු තොගය බාර ගැනීම ප්‍රතික්ෂේප කළේය.

පසුව ආහාරපාන සැපයීමේ ව්‍යාපාරයක නිරතව සිටින **ජෝන්** ට ගංවතුරෙන් හානියට පත් වූ (contaminated) පරිප්පු කිලෝග්‍රෑම් 100, **රවී** විසින් විකුණන ලදී. **රවී** පරිප්පුවල තත්ත්වය පිළිබඳව **ජෝන්ට** දැන්වූයේ නැත. කෙසේවෙතත්, මිනිස් පරිභෝජනයට සුදුසු තත්ත්වයෙන් පරිප්පු තොගය නොතිබූ බව **ජෝන්** පසුව සොයා ගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව පහත සඳහන් දෑ **විමසන්න**:

(a) **මොහාන්ගේ** නෛතික අයිතිවාසිකම්. (ලකුණු 05)

(b) **ජෝන්ගේ** නෛතික අයිතිවාසිකම්. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

<u>**කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව**</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |